ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 පෙබරවාරි 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය - 2018 ජනවාරි

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 දෙසැම්බර් මාසයේ දී වාර්තා කළ 59.1 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේ දී 51.7 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. ඒ අනුව, 2017 වසරේ අවසාන මාස දෙක තුළ දී දක්නට ලැබුණු සෘතුමය ඉහළ යෑමෙන් අනතුරුව, නිෂ්පාදන අංශයෙහි කටයුතු, 2017 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව ජනවාරි මාසයේ දී අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කෙරේ. මේ සඳහා, නිෂ්පාදන සහ නව ඇණවුම් උප දර්ශක වල දක්නට ලැබුණු මන්දගාමිත්වය ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, සේවා නියුක්ති උප දර්ශකය 2017 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේ දී මන්දගාමී වූ අතර ගැනුම් තොග උප දර්ශකය පහත වැටීමක් පෙන්නුම් කරන ලදී. මේ අතරතුරදී, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ ගියේය. තවද, ගැනුම් තොග උප දර්ශකය හැර සෙසු සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලද අතර, ඒ අනුව 2018 ජනවාරි මාසයේ දී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සමස්තයක් ලෙස වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ 61.2 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 ජනවාරි මාසයේ දී 56.6 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, නිම කිරීමට ඇති කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උපදර්ශකවල දායකත්වයෙන් 2018 ජනවාරි මාසයේ දී සේවා අංශය අඩු වේගයකින් වුව ද වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. සේවා නියුක්තිය 2018 ජනවාරි මාසයේ දී පහළ ගිය අතර එය නිම කිරීමට ඇති කාර්යයන්හි අඛණ්ඩව දෙවන වරටත් සිදු වූ වර්ධනයට යම් දායකත්වයක් සපයන ලදී. වසර ආරම්භයේ දී නව ව්‍යාපාර සහ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන ලද්දේ එය 2017 දෙසැම්බර් මාසයේ ඉහළ ක්‍රියාකාරී මට්ටම සමග සැසඳීම හේතුවෙන් විය හැකිය. සේවා සැපයීමේ මංපෙත්වල වර්ධනය හේතුවෙන් ප්‍රධාන වශයෙන් මූල්‍ය අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබුණි. විශ්‍රාමික සහ සේවය හැර ගිය සේවකයන් වෙනුවෙන් ඇතිවූ ඇබෑර්තු සඳහා බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් මූල්‍ය, සෞඛ්‍ය සහ දේපල වෙළෙඳාම් අංශවල සේවා නියුක්තිය පහළ ගියේය. සාමූහික වැටුප් ගිවිසුම් ද ඇතුළත්ව 2018 වසරේ නියමිත වැටුප් වර්ධන හේතුවෙන් අපේක්ෂිත ශ්‍රම පිරිවැය ඉහළ යන ලදී.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | - | - | - | - | - | - | - | - | - | - | - |
| සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | - | - | - | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.